**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2023**

**-----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට ආදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය

කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පෙර වර්ෂයේ ලැබිය යුතු පොලී ආදායම් ගිණුම තුල සිදු වූ වැරදි සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී වැරදි ලෙස ගැලපීම් කිරීමෙන් ආයෝජන ගිණුම සහ ආරම්භක සංචිත ගිණුම යන ගිණුම් දෙකම රු.10,355,671 කින් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයේ සඳහන් පරිදි 2022 වර්ෂයේ පොලී ආදායම නිවැරදි කිරිම 2023 වර්ෂයේ දි ගිණුම්කරන දත්ත පද්ධතියට ගිණුම්ගත කිරීමේ දි පෙර වර්ෂ ගැලපුම් හර කිරිම වෙනුවට ආයෝජන ගිණුම් හර වි ඇති හෙයින් විගණනයේ සඳහන් ගිණුම් ගත දෝෂය සිදුව ඇති අතර 2024 වර්ෂයේ දි අදාළ නිවැරදි ගිණුමට සටහන් කිරිමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී බද්දට පෙර ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට ගෙන නොතිබුණු රු.11,887,263 ක් වූ පෙර වර්ෂ ගැලපුම් ඇතුලත් කර තිබුණි. | ගිණුම් ප්‍රකාශන පිළියෙළ කිරිමේ දි බදු වලට පෙර ලාභය ලෙස ගිණුම් කාලයට ආදායම් හා වියදම් ගලපා ඉදිරිපත් කරන අතර එම ලාභ අලාභ ප්‍රකාශනයේ හි පෙර වර්ෂයන්හි ගැලපීම් පෙන්නුම් නොකරන බවත් එම ගැලපුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ අනිවාර්යයෙන්ම ගැලපිය යුතු අතර එසේ නොවේ නම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලිත නොවන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඇ) | වර්ෂයේ බදු පෙර ලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබුණු 2023 වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම වන රු.467,090 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි සටහන් විම මඟහැරි ඇත. එය ඉදිරි වර්ෂයන්හි දි මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසිමේ දි ඇතුළත් කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පතු කල් පිරීමෙන් පසු ලද ස්ථාවර තැන්පතු පොලී නැවත ආයෝජනය ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුල රු.55,421,025 ක මුදලක් පෙන්වා තිබුණද එම ශේෂය තුල පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් වැරදියට ගිණුම්ගත වීම් වලට අදාල රු.10,355,671 ක මුදලක් ද, වැරදි ගණනය කිරීම් තුලින් ජනනය වූ රු.66,455 ක මුදලක් ද, වර්ෂය තුල ලංකා බැංකුවේ ආයෝජනය කල රු.10,000,000 ස්ථාවර තැන්පතු මුදල ද ඇතුලත්ව තිබුණි. | වර්ෂයන්හි මුදල් ප්‍රවාහ ප්‍රකාශන සැදිමේ දි එසේ නොවිමට වග බලා ගැනිමට උපදෙස් ලබා දුනි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුලදී ආයතනයේ නිළධාරීන් 2 කුට රු.372,043 ක් ආපදා ණය ලබාදී තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල සේවක ණය ගෙවීම් ලෙස රු.672,480 ක් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසිමේ දි සේවක ණය ගෙවිම් ලෙස ගණු ලැබුවේ 2022 වර්ෂයේ අවසාන ශේෂය වූ රුපියල් 1,463,173 හා 2023 වර්ෂයේ අවසාන ශේෂය වූ රුපියල් 2,135,654 අතර ශුද්ධ වෙනස්විමය. එනම් 672,450 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගනු ලැබූ ආකාරය නිවැරදි බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඊ) | ආයතනයේ සේවකයන් 4 දෙනෙකු හට සිදුකර තිබූ වැඩිපුර වැටුප් | ඉදිරි වර්ෂයන්හි දි මුදල් ප්‍රවාහ ප්‍රකාශ සැදීමේ දි එවැනි වෙනස්කම් | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල |

| | | |
|---|---|---|
| ගෙවීම් මුදලින් වර්ෂය තුලදී රු.156,995 ක් අයකර ගෙන තිබූ අතර එම මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් කොට නොතිබුණු අතර, එම වැඩිපුර ගෙවූ වැටුපෙන් ඉතිරි මුදල වන රු.835,716 මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල කාරක ප්‍රාග්ධන සංචලන යටතේ පෙන්වීමට කටයුතු සිදුකර නොතිබුණි.<br>ජංගම වගකීම්වල වර්ෂයේ කාරක ප්‍රාග්ධන සංචලනය ලෙස රු.4,337,440 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට එකතු කොට ඇතත් එ් තුල පාරිතෝෂිත වල වෙනස්වීම් ඇතුලත්ව පැවතුණි. | ඇතොත් කාරක ප්‍රාග්ධන සංචලන යටතේ පෙන්වීමට සටහන් කර ගත් බව. | කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීතිරීති රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත | | | |
| (i) 20 (1) උපවගන්තිය | අමාත්‍යවරයා විසින් පනතේ විධිවිධාන යටතේ ආයතනයේ කර්තව්‍ය කිසිවක් හෝ ඒ සියල්ල කරගෙනයාමේ කාර්යය සඳහා සහ පනතේ මූලධර්මවලට බලාත්මකභාවයක් ලබාදීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි වුවත් එම නියෝග සාදා නොතිබුණි . | අදහස් දක්වා නොමැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) 11 වන වගන්තිය | ආයතනයේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍ය වියයුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරු වශයෙන් යම් | අදහස් දක්වා නොමැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තැනැත්තන් සංඛ්‍යාවක් සභාව විසින් පත්කරනු ලැබිය යුතු වුවත් එසේ නම් කර නොතිබුණි. | | |
| (ආ) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත 83 ඒ පරිච්ඡේදය 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත හා අංක PED 01/ 2023 චක්‍රලේඛය. | අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනයේ දී තනතුරට හිමි වැටුප් සහ දීමනා හැර එම තනතුරෙහි රාජකාරී ඉටු කිරීමේදී ලබාගත් සියලු දීමනා ද ඇතුළත්ව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කළ යුතු වුවද දේශන ගාස්තු, සම්පත් දායක ගාස්තු හා වාර්ෂික ප්‍රසාද දීමනා යනාදිය සැලකීමෙන් තොරව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය සිදුකර තිබුණි. | ඒ සම්බන්ධයෙන් මෙම කරුණු ගොණු කොට එකී ලේකම් කාර්යාලයෙන් විමසා උපදෙස් ඉල්ලා ඇති අතර ලැබෙන නිර්දේශ පදනම් කරගෙන ඉදිරියේ දි කටයුතු කිරිමට ගිණුම් අංශයට උපදෙස් ලබා දුන් බව. | දේශිය ආදායම් පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) භාණ්ඩාගාර පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තු වේ 2021 නොවැම්බර් 16 හා PED 2021/01 දරන මෙහෙයුම් අත්පොතෙහි (Operational Manual) 5.4 හා 2022 අගෝස්තු 08 දිනැති අංක 04/22 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය | වේදිකා නාට්‍යයක අනුග්‍රාහක කාර්යයක් සඳහා රු.100,000 ක මුදලක් 2023 අප්‍රේල් 10 දින වැයකර තිබුණි. | එය හුදෙක්ම ආයතනය විසින් කරන ලද පරිත්‍යාගයක් නොවන අතර පාඨමාලා ප්‍රවර්ධනය සඳහා දරණ අයෝජනයක් බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයෙහි අනුමත කාර්යය මණ්ඩලය, 25 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්යය මණ්ඩලය 15 ක් විය. කාර්යමණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 7න් 5ක්ම පුරප්පාඩුව පැවැති අතර ආයතනයේ කාර්යය හා කර්තව්‍ය මෙහෙයවීමේදී අණ පනත් මගින් පැවරෙන කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය පවරාදෙන කළමනාකරණ කාර්යයන් ඉටු කිරීමෙහි නිරත වන ප්‍රධාන විධායක නිලධාරී තනතුර වන අධ්‍යක්ෂ ජෙනරාල් තනතුර සදහා කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගෙන තිබුණි. | මේ වන විට ආයතනය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධික්ෂණය යටතේ පවතින හෙයින් 2024.02.28 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇති බව. | ආයතනයේ ඉදිරි පැවැත්ම උදෙසා විධිමත් මානව සම්පත් කළමනාකරණයක් සිදුකල යුතු බව. |